# පාලි ථූපවංසය පිළිබඳ විමසුමක්

පහලගම ධම්මික හිමි

පාලි සාහිත්‍යයෙහි වැදගත් සාහිත්‍යංගයක් වශයෙන් වංස කථා සාහිත්‍ය සඳහන් කිරීමට පුළුවනි. පාලි වංස කථා සාහිත්‍ය ඉතා පුළුල් පරාශයක් පුරා විහිදී යන ක්ෂේත්‍රයකි. 'වංස' යන්න කුලය පරම්පරාව යන අර්ථවල යෙදෙයි.[1] යම් ඓතිහාසික සංසිද්ධිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම වංස කථාවල අරමුණ වී ඇත. එහි දී විවිධ අරමුණු ඇතිව පාලි වංස කථා රචනා කොට තිබේ.

පාලි ථූපවංසය[2] රචනා කිරිමේ අදහස වී ඇත්තේ මහා ථූපයේ ඉතිහාසය කථා කීම සඳහාය. මහාථූපය නම් ස්වර්ණමාලී මහා චෛත්‍යයි. එහි ඉතිහාසය හා දුටුගැමුණු මහ රජුගේ බෝසත් චරිතය වර්ණනා කිරීම පාලි ථූප වංසයයේ අරමුණ වී ඇත. සංස්කෘත ස්තූප යන්න පාලියට ථූප ලෙසත් සිංහල තුබ ලෙසත් බිඳී ඇත. සර්වඥ ධාතු හෝ බුද්ධ ශ්‍රාවක තෙරවරුන්ගේ ශ්‍රී ධාතු තැම්පත් කොට ඉදිකරන ලද්ද ථූප නමින් හඳුන්වයි. එකී ථූපයන්හි හැඩය අනුව විවිධ වර්ගීකරණයන්ට ලක්කොට තිබේ. ථූපයක විශේෂ සැකැස්මක් හා ක්‍රමවේදයක් වාස්තු විද්‍යාවට අනුව දැක ගත හැකිය. පාලි ථූපවංසය ථූප යන්න ඉතා පැහැදිලි ලෙස හඳුන්වා දෙයි. "තත්ථ ථූපස්ස වංස වක්ඛාමි එත්ථ තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො. පච්චෙකබුද්ධො ථූපාරහො. තථාගතස්ස සාවකො ථූපාරහො. රාජා චක්කවත්ති ථූපාරහොති වචනතො ථූපාරාහාදීනං බුද්ධාදීනං ධාතුයො පතිට්ඨාපෙත්වා කතචෙතියං අබ්භුන්නට්ඨෙන ථූපොති වුච්චති"[3] පාලි ථූප වංසය රචනා කිරීමට පෙර සිංහල හා පාලි බසින් රචනා වූ ථූපවංස දෙකක් තිබූ බවත් එහි යම් යම් අපැහැදිලිතා නිසා පාලි ථූප වංසය රචනා කළ බව කර්තෘවරයාගේ අදහසයි.[4] මහින්දසේන පිරිවෙන් වැසි ත්‍රිපිටක පර්යාප්තිධර ශීලාදීගුණයන්ගෙන් යුත් පත්ත චීවර නම් තෙරුවහන්සේගේ ආරාධනයෙන් පාලි ථූපවංසය රචනා වී තිබේ.[5] සියලු රජුනට චූඩාමාණික්‍යයක් බඳු වූ පරාක්‍රමබාහු රාජ සමයේ දී එනම් ක්‍රි:ව: 1236-71 කාලයේ දී රචනා කොට තිබේ. පාලි ථූපවංසයේ

කර්තෘවරයා වාචිස්සර හිමියන්ය.[6] වාචිස්සර හිමියන් පරාක්‍රමබාහු රජුගේ අනුශාසකවරයා වශයෙන් කටයුතු කොට තිබේ. ටීකාචාර්ය ශාරිපුත්‍ර හිමියන්ගේ දෙවැනි ශිෂ්‍යයාය. මෙහි කර්තෘ වන වාචිස්සර හිමියන් විසින් පටිසම්භිදාමග්ගයට ලීනත්ථවණ්ණනාවක් ද සංක්ෂිප්ත විසුද්ධිමග්ග සන්නයක් ද සච්චසංඛේප සිංහලාර්ථ වණ්ණනාව ද යන කෘති කීහිපයක් ම සම්පාදනය කොට තිබේ. පොළොන්නරු යුගයේ පාලි භාෂා සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියා කළ හිමි නමක් වශයෙන් මෙහි කර්තෘවරයා සඳහන් කිරීම යුක්ති සහගතය.

පාලි ථූපවංසය අනෙක් පාලි වංස කථා අනුගත ක්‍රමය වූ තෙරුවන් පිණිපා කොට ග්‍රන්ථය ආරම්භ කිරීම වෙනුවට ශ්‍රී ධාතුවහන්සේ වැඩ සිටින මහා ථූපය වන්දනා කරයි. එසේම බුදුරදුන් ශ්‍රී ධාතුන් පිළිබඳ හා උන්වහන්සේ ශාරීරික පාරිභෝගික චෛත්‍ය කෙරෙහි ඇති අප්‍රමාණ භක්තිය හා ශ්‍රද්ධාව ඉන් ඉස්මතු වෙයි. ථූපවංස කර්තෘවරයා සිය වංස කථාව ආරම්භ කරන්නේ,

''යස්මිං සයිංසු ජිනධාතුවරා සමන්තා
ඡබ්බණ්ණරංසිවිසරෙහි සමුජ්ජලන්තා,
නිම්මාය ලොකහිතහෙතු ජිනස්ස රූපං
තං ථූපමබ්භුතතමං සිරසා නමිත්වා.''

මෙසේය. ලෝකයෙහි යහපතට හේතු වූ බුද්ධ රූපය මවා ෂඩ්වර්ණයෙන් යුක්ත ඝන බුද්ධ රශ්මි මාලවෙන් බබළන්නා වූ බුදුරජාණන් වන්සේගේ ශ්‍රී ධාතූන් යම් ස්ථානයක සැතපුණා ද ඒ ආශ්චර්යජනක ථූපයට වැඳ යනුවෙන් මහා ථූපය පිළිබඳ විස්තර කථාව ආරම්භ කොට තිබේ. ඉන් අනතුරුව කර්තෘවරයා සිදු කරන කාර්ය පිළිබඳ අදහස ප්‍රකාශ කරන්නේ මෙසේය.

''වක්ඛාමහං සකලලොකහිතාවහස්ස
ථූපස්ස සබ්බජනනන්දනකාරණස්ස,
වංසං සුරාසුරනරිදවරෙහි නිච්චං
සම්පූජිතස්ස රතනුජ්ජ ලථූපිකස්ස.''



සුර අසුර රාජ ආදී ශ්‍රේෂ්ඨයන් විසින් නිතර පුදන ලද රත්නයන්ගේ විභූසිත කොත් කැරලි ඇති සියල්ලන්ගේ චිත්තාහ්ලාදයට හේතු වන්නා වූ ද ලෝකයාට හිත සුව ඇති කරන ථූපවංසය ප්‍රකාශ කරන බවයි. එසේම කර්තෘවරයා මැනවින් ප්‍රකාශ කරන පරිපූර්ණ හා නිරවුල් වූ බුදුරජාණන් වහන්සේගේ ථූපවංස පිළිබඳ පුවත ශ්‍රවණයට ආරාධනා කරනු ලබයි.[8] කර්තෘවරයා මහා ථූපය පිළිබඳ විස්තර කථා දැක්වීමට පෙර ඊට අදාළ පුවත සංක්ෂේපයෙන් ඉදිරිපත් කරයි. ''යො දීපඞ්කරාදීනං චතුවීසතියා බුද්ධානං සන්තිකෙ ලද්ධව්‍යාකරණො සමතිංසපාරමියො පූරෙත්වාපරමාභිසම්බොධිං පත්වා ධම්මචක්කප්පවත්තනතො පට්ඨාය යාව සුභද්දපරිබ්බාජකවිනයනා සම්බුද්ධකිච්චානි නිට්ඨාපෙත්වා අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ධාතුයො පතිට්ඨාපෙත්වා කතො. අයමෙත්ථ සඞ්ඛෙපො. විත්ථාරො පන වෙදිතබ්බො.'' යනුවෙන් යමෙක් දීපඞ්කර ආදී සූවිසි බුදුවරුන්ගෙන් විවරණ ලැබ සමතිසක් පාරමිතා පුරා උතුම් වූ බුද්ධත්වයට පත්ව දම්සක් දේසනා කොට සුභද්ද පිරිවැජියා හික්මවීම දක්වා වූ බුද්ධ කෘත්‍ය නිමවා අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීම සිදු වූ ගෞතම බුදුරදුන්ගේ ධාතු පිහිටුවා කළ මහාථූපය පිළිබඳ සංක්ෂේපාර්ථය බවත් විස්තර දත යුතුය, යනුවෙනි. ථූපවංසය සංග්‍රහ කිරීමේ දී පරිච්ඡේදක්‍රමය භාවිත කර තිබේ. ඒ අනුව ග්‍රන්ථ අන්තර්ගතය තුළ පරිච්ඡේද දාහතක් අන්තර්ගත වෙයි.

1. අභිනීහාර කථා
2. සූවිසි බුදුරදුන් හමුවෙහි අභිනීහාර කථා
3. චතු වීසති බුද්ධ ථූප කථා
4. චූලාමණි දුස්සය ථූපද්වය කථා
5. දස ථූප කථා
6. ධාතු නිධාන කථා
7. චතුරාසීති සහස්ස ථූප කථා
8. ථූපාරාම කථා
9. බෝධි ආගමන කථා
10. යෝජන ථූප කථා

11. මහියංගන ථූප කථා
12. මරිචවට්ටි ථූප කථා
13. ථූප සාධන ලාභ කථා
14. ථූපාරම්භ කථා
15. ධාතු ගබ්බරූප වණ්ණනා කථා
16. ධාතු නිධාන කථා
17. මහාචෙතිය කථා

පාලි ථූපවංසය ආරම්භ කරන්නේ සුමේධ තාපස කාලයේ පටන් සූවිසි බුදුවරුන්ගෙන් විවරණ ගැනීම, සිදුහත් කුමාරෝත්තපත්තියේ පටන් සම්බුද්ධ පරිනිර්වාණයත් ඉන් පසු ධාතු බෙදීමත්, ධර්මාශෝක රජුගේ යෝජන ථූපය පිහිටුවීමේ පටන් ලක්දිව බුදුසසුන පිහිටු වීම දක්වා තොරතුරුත් ථූපවංසයේ ඉදිරිපත් කරයි. බෝධිසත්ත්වයන් වහන්සේ දීපඞ්කර බුදුරදුන්ගෙන් නියත විවරණ ලබාගත් ආකාර සංක්ෂිප්තව දැක්වීමෙනි.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර අමරාවතී නම් නුවරක් වීය. එහි සුමේධ නම් බමුනෙක් වාසය කළේය. ඔහු ශිල්ප ශාස්ත්‍ර හදාරන කාලයේ මව් පියෝ මරණයට පත් වූහ. ඉන් පසු තම මව් පියන් සතු ධනය මහ ජනයාට දන් දී හිමවතට පිවිස තවුස් පැවිද්දෙන් පැවිදි විය. සතියක් ඇතුළත පඤ්ච අභිඤ්ඤා හා අෂ්ටසමාපත්ති උපදවා කල්ගත කළේය. එම කාලයෙහි දීපඞ්කර බුදුරදුන් සත්සතිය ගෙවා දම්සක් පවත්වා හාරලක්ෂයක් මහ රහතන් වහන්සේලා පිරිවරා රම්‍යගම් නුවර සුදර්ශන මහා විහාරයෙහි වාසය කළ සේක. එකල්හි රම්‍යගම් නුවර වාසීහු දීපඞ්කර බුදුරදුන් වහන්සේ වඩින මාර්ගය පිරිසිදු කරන්නේ වූහ. සුමේධ තාපසයෝ ද එහි පැමිණ ඊට සහභාගී වීය. තමාට ලද භූමි භාගය පිරිසිදු කොට අවසන් නොවූ කල්හි දීපඞ්කර බුදුරදුන් මඩමතින් වැඩම වීම නුසුදුසු බව සිතා මඩ මත වැතිරුණේය. එම අවස්ථාවේ දී දීපඞ්කර බුදුරදහු ''පස්සථ නො තුම්හෙ භික්ඛවෙ ඉමං උග්ගතපං තාපසං කලලපිට්ඨෙ නිපතන්ති, එවං භන්තෙ, අයං බුද්ධත්ථාය අභිනීහරං කත්වා නිපන්නො, සමිජ්ඣිස්සති ඉමස්ස පත්ථනා කප්පසතසහස්සාධිකානං චතුන්නං අසඞ්ඛෙය්‍යානං මත්ථකෙ



ගොතමො නාම බුද්ධො භවිස්සතීති සබ්බං ව්‍යාකාසි'' මේ සුමේධ තාපසයා අනාගතයෙහි අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරකට පසු ගෝතම නමින් බුදුවන බව ප්‍රකාශ කළහ. ඉන් අභිනීහාර කථා අවසන් වෙයි.

ඉන්පසු සූවිසි බුදුවරුන් හමුවෙහි විවරණ ගැනීම හමුවෙයි. එහි දී ඒ ඒ බුදුරජාණන් වහන්සේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. එකී තොරතුරු මෙසේ වගු ගත කළ හැකිය.

| සූවිසි බුදුරජාණන් වහන්සේ | බෝසතුන් | පිරිනිවිනි ස්ථානය | ථූපයේ ප්‍රමාණය | ධාතු |
|---|---|---|---|---|
| 01. දීපඞ්කර බුදුරදුන් | සුමේධ තාපස | නන්දාරාමය | යොදුන් 37 යි | නොවිසිසුරුණභ |
| 02. කොණ්ඩඤ්ඤ බුදුරදුන් | විජිතාවි සක්විති රජ | නන්දනාරාමය | යොදුන් 07 යි | නොවිසිසුරුණභ |
| 03. මංගල බුදුරදුන් | සුචි බමුණා | වසභ නම් උයන | යොදුන් 30 යි | නොවිසිසුරුණභ |
| 04. සුමන බුදුරදුන් | අතුල නාග රාජ | අග්ගාරාමය | යොදුන් 07 යි | නොවිසිසුරුණභ |
| 05. රේවත බුදුරදුන් | අතිදේව බමුණා | මහපුරය | විවිධ ප්‍රදේශවල | විසිරුණභ |
| 06. සොභිත බුදුරදුන් | | සීහාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණභ |

| | | | | |
|---|---|---|---|---|
| 07.අනෝම දස්සි බුදුරදුන් | යක්ෂ සේනාපති | ධර්මාරාමය | යොදුන් 25 යි | නොවිසිසුරුණහ |
| 08.පදුම බුදුරදුන් | සිංහයෙක් | ධර්මාරාමය | | විසිරුණහ |
| 09. නාරද බුදුරදුන් | | සුදර්ශනාරාමය | යොදුන් 04 යි | නොවිසිසුරුණහ |
| 10. පදුමුත්තර බුදුරදුන් | ජටිල නම් වැසියෙක් | නන්දාරාමය | යොදුන් 12 යි | නොවිසිසුරුණහ |
| 11. සුමේධ බුදුරදුන් | උත්තර මානවක | මේධාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණහ |
| 12. සුජාත බුදුරදුන් | සක්විති රජ | සීලාරාමය | ගව් 03 යි | නොවිසිසුරුහ |
| 13. පියදස්සි බුදුරදුන් | කස්සප මානවක | සල්ලාරාමය | යොදුන් 03 යි | නොවිසිසුරුහ |
| 14. අත්ථදස්සි බුදුරදුන් | සුසිම තාපස | අනෝමාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණහ |
| 15. ධම්මදස්සි බුදුරදුන් | සක්දෙව් රජ | කේසලාරාමය | යොදුන් 03 යි | නොවිසිසුරුණහ |
| 16. සිද්ධත්ථ බුදුරදුන් | මංගල තාපස | අනෝමාරාමය | යොදුන් 04 යි | නොවිසිසුරුණහ |
| 17. තිස්ස බුදුරදුන් | සුජාත රජ | නන්දාරාමය | යොදුන් 03 යි | නොවිසිසුරුණහ |
| 18. ඵුස්ස බුදුරදුන් | විජිතාවි රජ | සුනන්දාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණහ |
| 19. විපස්සි බුදුරදුන් | අතුල නාග රාජ | සුමිත්තාරාමය | යොදුන් 07 යි | නොවිසිසුරුණහ |
| 20. සිඛී බුදුරදුන් | අරින්දම රජ | ඵුස්සාරාමය | යොදුන් 03 යි | නොවිසිසුරුණහ |
| 21. වෙස්සභූ බුදුරදුන් | සුදස්සන රජ | ඛේමාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණහ |



| | | | | |
|---|---|---|---|---|
| 22. කකුසඳ බුදුරදුන් | ඛේම රජ | ඛේමාරාමය | ගව් 01 යි | නොවිසිසුරුණහ |
| 23. කෝණාග මන බුදුරදුන් | පබ්බත රජ | පබ්බතාරාමය | විවිධ ප්‍රදේශවල | විසිරුණහ |
| 24. කස්සප බුදුරදුන් | ජෝතිපාල මානවක | ජේතවනා නුවර | යොදුන් 01 යි | නොවිසිසුරුණහ |

සෝභිත බුදුරජාණන් වහන්සේගෙන් හා නාරද බුදුරජාණන් වහන්සේගෙන් විවරණ ගත් බව දැක්වූව ද ගෝත්‍ර නාමය දක්වා නැත. සෝභිත බුදුරජාණන් වහන්සේගේ බෝසතුන් සුජාත බමුණු නමින් නාරද බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජටිලයෙක් වශයෙන් ද උපත ලද බව දැක්වේ.[9] සූවිසු බුදුවරුන් හමුවෙහි අභිනීහාර කථාවෙහි මෙකී තොරතුරු ඇතුළත් වෙයි.

මහ බෝසතුන් තුසිත දිව්‍ය ලෝකයෙන් චුතව මනුස්ස ලෝකයේ පිළිසිඳ ගැනීම, සතරපෙර නිමිති දැකීම, මහාභිනිෂ්ක්‍රමණය සිදු කිරීම, ආදිය චූගි මණිදුස්ස ථූපද්වය කථාවෙහි අන්තර්ගත වෙයි. බුද්ධත්වයට පත්වීම, සත්සතිය ගතකිරීම, දම්සක් පැවතුම් දේශනය, ආදී වශයෙන් බුදුරදුන්ගේ චරිත හ බැදි සුවිශේෂ සංසිද්ධි රාශියක් පරිනිර්වාණය දක්වා විස්තර කරයි. ඉන් අනතුරුව බුදුරදුන්ගේ ධාතූන් වහන්සේලා නිධන් කොට ගොඩ නැගූ ථූප දෙකක් පිළිබඳව සඳහන් කරයි.

දස ථූපයන් ඒ ඒ ප්‍රදේශවල පිහිටු වූ පසු එම ථූපවලට සිදු විය හැකි අනතුරු මහා කස්සප මහරහතන් වහන්සේ විසින් අජාසත්ත රජුට දන්වා එම ධාතූන් වහන්සේලාට අවශ්‍ය ආරක්ෂාව සැලැස්වීමට ක්‍රියාත්මක වීම, මෙම පරිච්ඡේදයෙහි ඇතුළත්ය. විවිධ ස්ථානවල නිධන් කොට තිබූ සර්වඥ ධාතූන් මහ ජනයාට වැඳුම් පිදුම් කිරීමට අවශ්‍ය පමණ තබා අනෙක් ධාතූන් වහන්සේලා ගෙනවිත් එක් ස්ථානයක නිධන් කොට එහි ආරක්ෂාවට විශේෂ ක්‍රියාමාර්ග ගත් ආකාරය ධාතු නිධාන කථා නම් පරිච්ඡේදයෙහි අන්තර්ගත වෙයි.

අසෝක මහ රජුගේ අභිෂේකය, නිග්‍රෝධ සාමණේරයන්ගේ ක්‍රියාකලාපයෙන් අසෝක රජු පැහැදීම, ඊට අදාළ තොරතුරු දැක්වීම, අසෝක මහ රජු තිසරණය සමාදන්වීම, අසෝකාරාමය ඉදිකිරීම,

අසූහාරදහසක් වෙහෙර විහාර කර වීම, එය නිමිති කොට මෙම පරිච්ඡේදය චතුරාසීතිසහස්ස ථූපකථා යනුවෙන් නම් කොට තිබේ.

ඒ ඒ රටවල් සඳහා ධර්මදූතයන් වහන්සේලා පිටත්කර යැවීම, තම්බපණ්ණි දිවයිනට මහා මහින්ද තෙරුන් ප්‍රධාන ධර්ම දූතයන් වහන්සේලා පිටත්කර වීම, උන්වහන්සේලා පොසොන් පුන් පොහෝ දින අම්බස්තලයට වැඩම වීම, දෙවන පෑ තිස්ස රජු මුණ ගැසීම, විවිධ සූත්‍ර මූලික කොට මහින්ද තෙරුන් වහන්සේ ධර්ම දේශනා කිරීම, දෙවන පෑ තිස්ස රජු පැහැදී මහමෙවුනා උයන් සඟ සතු කිරීම, සුමන සාමණේරයන් දඹදිවින් සර්වඥ ධාතූන් වහන්සේලා වැඩම කර වීම, එකී ධාතූන් වහන්සේලා නිධන් කිරීම සඳහා ථූපාරාමය ඉදිකිරීම, ධාතු පූජා පැවැත් වීම, ථූපාරාම කථාවෙහි අන්තර්ගත වෙයි. එකී පරිච්ඡේදය අවසන් වන්නේ ''සාධුජනමනොපසාදත්ථාය කතෙ ථූපවංසෙ ථූපාරාම කථා''[10] යනුවෙනි.

දෙවන පෑ තිස්ස රජුගේ සහෝදරයකුගේ බිරිඳ වූ අනුලා බිසව පැවිද්ද ඉල්ලීම, එකී පැවිද්ද ලබාදීමට සඟමිත් තෙරණිය වැඩම වීම සඳහා දඹදිවට හසුන්පත් යැවීම, සඟමිත් තෙරණියන් සමඟ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම වීම, එහි ඊට පුදසත්කාර පූජා පැවැත් වීම, ලක්දිවට වැඩම වූ බෝධි ශාඛාව මහමෙවුනා උයනෙහි රෝපණය කිරීම හා ඉට පුදසත්කාර පූජා පැවැත් වීම, බෝධි ආගමන කථාවෙහි අන්තර්ගත වෙයි.

අනුලා බිසව හා සපරිවාර පිරිස කාන්තාවන් පැවිදි වීම, දෙවන පෑ තිස්ස රජුගේ බෑනා වූ අරිට්ඨ පන්සියක් පිරිස සමඟ පැවිදි වීම, භික්ෂූන්ට උපෝසථ කර්ම සඳහා ලෝවාමහාප්‍රාසාදය ඉදිකිරීම පිළිබඳ පූර්ව නිමිති කීම, දෙවන පෑ තිස්ස රජුගේ මුනුපුරු වන දුටුගැමුණු රජු විසින් ස්වර්ණමාලී මහා ථූපය තනවන බව දැක්වෙන ශිලාස්තම්භය ප්‍රතිෂ්ඨාපනය කිරීම, දෙවන පෑ තිස්ස රජු විසින් සර්වඥ ධාතූන් තැම්පත් කොට යොදුනක් යොදුනක් පාසා ථූප කර වීම, එම නිසා මෙම පරිච්ඡේදය යෝජන ථූප කථා වශයෙන් නම් කොට තිබේ.

ඉන් පසු අනුපිළිවෙළ කථාවක් ඔස්සේ දෙවන පෑ තිස්ස රජුගේ සිට දුටුගැමුණු රජු දක්වා ලක්දිව විටින් විට රජකම් කළ රජවරුන්



හා ඔවුන්ගේ කාලච්ඡේදයන් දැක්වීම, ගාමිණී අභය හා තිස්ස කුමාරවරුන්ගේ උත්පත්තිය, කාවණ්තිස්ස රජුගේ මරණය, ගාමිණී අභය හා තිස්ස කුමරු අතර ඇති වූ යුද්ධ, භික්ෂූන් වහන්සේගේ මැදිහත් වීමෙන් ඔවුන් දෙදෙනා අතර සමථකරණය, මහියංගණ ථූපය කරවීම දක්වා මහියංගණ ථූප කථාවෙන් තොරතුරු ඉදිරිපත් කරයි.

විජිතපුර සටන, ලක්දිව එක්සේසත් කිරීම, දස මහා යෝධයන්ට තනතුරු ප්‍රදානය කිරීම, ථෙරපුත්තාභය යෝධයා පැවිදි වීම, මිරිස වැටිය ථූපය ඉදිකිරීම දක්වා තොරතුරු මරිචවට්ටි ථූප කථාවෙහි ඇතුළත්ය.

දුටුගැමුණු රජු විසින් විචිත්‍රාකාරයෙන් කරවන ලද ලෝවාමහාප්‍රාසාදය පිළිබඳ තොරතුරු, අනුරාධපුරය කේන්ද්‍ර කොට ගෙන විවිධ දිසාවල පහළ වූ රන් රිදී මුතු මැණික් ආදී වටිනා වස්තූන් පිළිබඳ රජු දැන ගැනීම, ආදී තොරතුරු ථූප සාධනලාභ කථාවෙහි අන්තර්ගත වෙයි.

මහා ථූපයට මංගල සිලා ස්ථාපනය කිරීම සඳහා වූ මහෝත්සවයට දඹදිවින් වැඩිය භික්ෂූන් වහන්සේ පිළිබඳ පුවත්, ලක්දිව නොයෙක් දිසාවලින් වැඩිය භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු, මංගල සිලා ස්ථාපනය කිරීම, ඒ නිමිති කොට පුද පූජා පැවැත් වීම, ධර්ම දේශනා කිරීම, සිවුවනක් පිරිස මග ඵල අවබෝධ කර ගැනීම, ආදී තොරතුරු ථූපාරම්භ කථාවෙහි ඇතුළත් වෙයි.

මහ සෑයේ ධාතු ගර්භය විවිධ දෑ භාවිත කරමින් අලංකාර කොට තිබෙන ආකාරය, බුද්ධ චරිතයේ විවිධ අවස්ථා රූපණය කොට තිබීම, සූත්‍ර දේශනා, ජාතක දේශනා ආදී තොරතුරු ද භාතික රජු ධාතු ගර්භය තුළට රැගෙන ගොස් වැඳුම් පිදුම් කිරීමට අවස්ථාව සැලැස්ස වීම, භාතික රජු ධාතු ගර්භයේ දුටු විචිත්‍රවත් දෑ ප්‍රතිනිර්මාණය කිරීම, මහා ථූපයේ ධාතු ගර්භය බිතු සිතුවම්, ප්‍රතිමූර්ති ආදියෙන් අලංකාර කර වූ ආකාරය ධාතු ගබ්බරූපවණ්ණනා කථා පරිච්ඡේදයෙහි අන්තර්ගත වෙයි.

ධාතු නිධානයට සූදානම් වීම, ෂඩ් අභිඥාලාභී පුද පිරිවෙන් වාසී සෝණුත්තර සාමණේරයන් වහන්සේට ධාතු වැඩමවීමට භාරදීම,

නාගලෝකයෙන් ධාතූන් වහන්සේලා වැඩම වීම, ධාතු පූජා පැවැත් වීම, ධාතු පෙළහර පෑම, උත්සවාකාරයෙන් ධාතු නිධන් කිරීම, ඉන් අනතුරුව දන් දීම හා පුද පූජා පැවැත් වීම, ධාතු ගර්භයේ දැල් වූ පහන් නොනිමෙන ලෙසත් මල් නො මැළවෙන ලෙසත් මැණික් දුර්වර්ණ නොවන ලෙසත් අධිෂ්ඨාන කිරීම, ආදිය දැක්වේ. ''ඉති සාධුජන මනොපසාදත්ථාය කතෙ ථූපවංසෙ ධාතු නිධාන කථා නිට්ඨිතා''[11] යනුවෙන් ධාතු නිධාන කථාවෙහි තොරතුරු අන්තර්ගත වෙයි.

ධාතු ගර්භය වස්සවා හතරැස් කොට නිමා කරවීම, මහසෑයේ ඡත්‍ර කර්ම හා සුධා කර්ම නිමා වීමට පෙර දුටුගැමුණු රජතුමා රෝගාතුර වීම, දිගාමඩුල්ලේ සිටි සද්ධාතිස්ස කුමරු අනුරාධපුරයට කැඳවීම, මහා ථූපය වහා නිම කළ නොහැකි බැවින් රෙදිවලින් නිම කොට දුටුගැමුණු රජුට දැක්වීම, මරණාසන්න වූ රජුට කළ පින්කම් පිළිබඳ සිහිකරවීම, සද්ධාතිස්ස කුමරු රජවී මහා ථූපය සදාවා නිමා කරීම, පුද පූජා පැවැත්වීම, ආදිය ''ඉති සාධුජනමනොපසාදත්ථාය කතෙ ථූපවංසෙ මහා චෙතියකථා නිට්ඨිතා''[12] යනුවෙන් මහා චෛතිය කථාවේ තොරතුරු ඇතුලත් වෙයි. ථූපවංස කර්තෘවරයා දුටුගැමුණු රාජ පුවත් දැක්වීමට ග්‍රන්ථයේ වැඩි කොටසක් වැය කොට තිබේ.

පාලි ථූපවංසයේ රචනා ශෛලිය දෙස බැලීමෙන් පෙනී යන්නේ එකල ඉමහත් ශ්‍රද්ධාවෙන් ශ්‍රවණය කළ කෘතියක් බවයි. ශ්‍රවණ මාධූර්ය මෙහි අනූනය. භාෂාව සරලය. සුගමය. බුද්ධ චරිතය හා සබැඳි මාරසංග්‍රාමය, මරඟන රැඟුම්, නාග විලාපය ආදී කථා පුවත් රචනා ශෛලියෙහි ස්වභාවය ඉස්මතුව පෙනීය යි. කථාපුවත් දැක්වීමේ දී විටෙක සංක්ෂේප බව හා විටෙක විස්තාරිත බව කර්තෘවරයාගේ රචනා ක්‍රමයක් සේ හඳුනා ගැනීමට පුළුවනි. වර්ෂ හතලිස් පහක් වූ බුද්ධ දිවිය වාක්‍ය ඛණ්ඩයකින් දක්වයි. ''අසාළ්හිපුණ්ණමදිවසෙ ඉසිපතනෙ මිගදායෙ පඤ්චවග්ගියානං භික්ඛූනං වසනට්ඨානං පත්වා තෙ අනනුච්ඡවිකෙන ආවුසො වාදෙන සමුදාචරන්තෙ සඤ්ඤාපෙත්වා ධම්මචක්කම්පවත්තෙන්තො අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරප්පමුඛෙ අට්ඨාරස කොටියො අමතපානං පායෙසි, තතො පට්ඨාය පඤ්චචත්තාළීසසංවච්චරානි ඨත්වා චතුරාසීතිධම්මක්ඛන්දසහස්සානි දෙසෙත්වා ගණනපථමතීතෙ සත්තේ භවකන්තාරෙ''[13] සම්බුද්ධ පරිනිර්වාණය දීර්ඝව විස්තරයක් කරයි. විටෙක කෙටි වාක්‍ය ද තවත්



විටෙක දීර්ඝ වාක්‍ය ද භාවිත කරයි. අනුලා බිසව පැවිද්ද ඉල්ලීම දක්වන අවස්ථාවේ භාවිත කරන වාක්‍ය කෙටිය. එමෙන් සරලය. ''නිට්ඨිතාය පන ධාතුපූජාය පතිට්ඨිතෙ ධාතුවරෙ මහාමහින්දත්ථෙරො මහාමෙඝවනුය්‍යානං ගන්ත්වා වාසං කප්පෙසි. තස්මිං ඛො පන සමයෙ අනුලාදෙවි පබ්බජිතුකාමො හුත්වා රඤ්ඤො ආරොචෙසි. රාජා තස්සා වචනං සුත්වා ථෙරං එතදවොච. භන්තෙ, අනුලාදෙවි පබ්බජිතුකාමා පබ්බාජෙතන්ති. න මහාරාජ, අම්හාකං මාතුගාමං පබ්බාජෙතුං කප්පති. පාටලීපුත්තෙ පන මය්හං භගිනී සංඝමිත්තා ථෙරී නාම අත්ථි. තං පක්කොසාපෙහි. මහාරාජ ඉමස්මිං දීපෙ පුරිමකානඤ්ච තිණ්ණං සම්මාසම්බුද්ධානං බොධි පතිට්ඨාසි.''[14] දීර්ඝ වාක්‍ය සහිත සමාසවත් පද භාවිත කරන අවස්ථාද දක්නට ලැබේ. ''පරිනිබ්බුතෙ පන භගවති ධම්මසෙනාපතිසාරිපුත්තත්ථෙරස්ස අන්තෙවාසිකො සරභූ නාමෙකො ථෙරො චිතකො ගීවට්ඨිධාතුං ගහෙත්වා භික්ඛුසංඝපරිවුතො ආගන්වා තස්මිංයෙව චෙතියෙ පතිට්ඨාපෙත්වා මෙඝවණ්ණපාසාණෙහි ඡාදෙත්වා ද්වාදසහත්ථුබ්බෙධං ථූපං කාරෙත්වා පක්කාමි. අථ දෙවානම්පියතිස්සරඤ්ඤො භාතා චූළාභයො නාම තං අබ්භුතං චෙතියං දිස්වා තිංසහත්ථුබ්බෙධං චෙතියං කාරෙසි, ඉදානි දුට්ඨගාමණීපි අභයරාජා අභියඞ්ගණං ආගන්වා තත්ථ දමිළෙ මද්දන්තො අසීතිහත්ථුබ්බෙධං කඤ්චුකචෙතියං කාරෙත්වා පූජාමකාසි.''[15] අවස්ථා නිරූපනය ඉතා උත්කෘෂ්ට අන්දමින් සිදු කොට තිබේ.

කුසිනාරාවෙහි මල්ල රජ දරුවන්ගේ උපවර්තන සල් උයනේ සම්බුද්ධ පරිනිර්වාණය සිදු වන ආකාරය ආශ්චර්යජනක ලෙස වර්ණනාවට ලක් කරයි. වෙසක් පුන් පොහෝ දින දකුණු සෙය්‍යාවෙන් සිහියෙන් යුත්තව බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී වදාළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේට පූජා පිණිස ''මුල පටන් අග දක්වා සියලු ආකාරයෙන් සුපිපි සල් ගස් දෙක එකසේ ගැවසී ගත්හ. ඒ උයනෙහි පමණක් නොව දසදහසක් සක්වල එල එටගන්නා ගස්වල එල හටගත්හ. සියලු ගස්වල කඳන්වල මල් ද වැල්වල මල්ද අහසෙහි එල්ලෙන මල් ද හටගත්හ. භූමි තලය බිඳගෙන දඬු පයුම් පිපුණාහ. මහ මුහුද පස් පියුම් ගවසී ගත්තාහ.''[16] ආදී වශයෙන් පරිසරය පිළිබඳ වර්ණනාවක් යොදා තිබේ.

ඉතිහාස පුවතක් භක්තියෙන් යුක්තව දැක්වුවද රුචිකත්වයෙන් කියවීම සඳහා වූ උපමා භාවිත කිරීම කර්තෘවරයාගේ රචනා ශෛලියෙහි විශේෂිත ගුණයක් වශයෙන් හඳුනා ගැනීමට පුළුවනි. කර්තෘවරයා විසින් ඉදිරිපත් කරන ප්‍රකාශන වඩාත් තහවුරු වන්නේ භාවිත උපමා තුළිනි. ඒ සඳහා ඉඩප්‍රස්තා කර්තෘවරයා ලබාගෙන තිබේ. දීපඞ්කර බුදුරජාණන් වහන්සේ රඹගම් නුවර වඩින අවස්ථාවේ දී උන්වහන්සේ වර්ණනා කිරීමට යොදන උපමා මෙසේය.

- දෑ සමන් මල් වැනි වර්ණයෙන් යුක්ත දෙපට සිවුර,
- රත්තරන් හවඩියකින් මල් කලාපයක් වටකරන්නා මෙන්,
- විදුලියක් මෙන් සශ්‍රීක වූ පටිය බැඳ,
- රත්තරන් පර්වතයක් මුදුනින් ලාකඩ මිශ්‍ර ජලය වත්කරන්නා මෙන්,
- රත්තරන් ථූපයක් පබලු දැලින් වටකරන්නාක් මෙන්,
- රත්තරන් ඇගෑයක් රත්තරන් පලසකින් මුදවන්නාක් මෙන්,
- සරත් කාලයෙහි සඳ රතු වලාකුළකින් වසන්නාක් මෙන්,
- රත්තරන් ගුහාවකින් නික්මෙන සිංහරාජයකු මෙන්,
- ශක්‍රයා මෙන්,
- මහාබ්‍රහ්මයා මෙන්,
- සරත් කාලයෙහි සඳ අහසට නගින්නාක් මෙන්,[17]
- මොනරපිල් කලාපයක් මෙන්
- ගව ඇසක් මෙන්,
- මනාකොට බඳනා ලද පුප්ඵාවතංසකයක් මෙන්,
- මල් සමූහයක් මෙන්[18]

ගද්‍ය මෙන් ම පද්‍යත් කර්තෘවරයා භාවිත කොට තිබේ. එහි දී බොහෝ පද්‍ය බුද්ධවංසයෙන් උද්ධෘත කොට ගෙන තිබෙන බව පැහැදිලි වෙයි. ඒ සඳහා ''වුත්තං හෙතං බුද්ධවංසෙ'' බුද්ධවංසයේ



කියල ලදී යනුවෙන් දක්වයි. ඉන්පසු ''තෙන වුත්තං'' එහි දී කියන ලදී, යනුවෙන් දක්වයි. බුද්ධවංසය හා සංසන්දනය කිරීමෙන් ගාථා රැසක් උද්ධෘත කළ ආකාරය දැකගත හැකිය.

බුදුරජාණන් වහ්සේගේ පරිනිර්වාණයෙන් පසු සිදු කළ ධාතු බෙදීමේ දී ඒ ඒ රජුවරු අතර ඇති වූ කලහය සන්සිඳු වීම මෙහි දී වැදගත් වෙයි. එහි දී කර්තෘවරයා ද්‍රෝණ බමුණාගේ මුවගට නන්වන්නේ බෝසත් සමයේ ගත කළ ආදර්ශ සම්පන්න වූ භවාන්තර කථාවන්ය. ''අපගේ බුදුරජාණන් වහන්සේ ක්‍ෂාන්තිවාදීයහ. බුද්ධත්වට නොපැණ පාරමී පුරන ක්‍ෂාන්තිවාදී තාපස කාලයේ ද ධර්මපාල කුමාර කාලයේ ද ඡද්දන්ත හත්ථි කාලයේ ද චම්පෙය්‍යනාග රාජ කාලයේ ද සංඛපාල නාග රාජ කාලයේ ද මහා කපි කාලයේ ද ක්‍ෂාන්තිය ම කළහ''[19] ශ්‍රාවකයාගේ හෝ පාඨකයාගේ සිතේ ඇති වන්නා වූ මනෝභාවයන් සංසිඳවීමෙහි මෙබඳු ප්‍රයෝග භාවිත කළා විය හැකිය. කෙසේ වෙතත් රචනයේ ප්‍රධාන කථාව අරමුණ කරා ගමන් කරවීමට අවශ්‍ය විටක අතුරු කථා සංක්‍ෂේපයෙන් සිහි ගැන් වීම මෙහි දී දැකිය හැකිය.

පාලි ථූපවංසය ඌනතා ඇති කෘතියක් වශයෙන් ඇතමෙක් විස්තර කරති. ඒ සඳහා විවිධ හේතු කාරණා ද ඉදිරිපත් කරති. එනමුදු ශ්‍රාවකයාට රුචිකත්වයෙන් ශ්‍රවණය කළ හැකි කෘතියකි. පාඨයාට සුඛයෙන් කියවිය හැකි කෘතියකි. ඊට පරිභාවිත භාෂාව බෙහෙවින් බලපායි. භාෂාවේ යම් යම් යෙදීම් ක්‍රමවල ලුහු බව පෙනුනත් බෞද්ධ ඉතිහාසය කියාපාන කෘතියක් සේ අගය කළ හැකිය. ඉතිහාස මූලාශ්‍රයක් වශයෙන් එලදායි වෙයි.

## ආන්තික සටහන්

1. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1998, 436 පිටුව.
2. සොදානි නිට්ඨං සම්පත්තො - ථූපවංසො අනාකුලො, වාචිස්සර හිමි, දෙවුන්දර, ථූපවංසො, ගොඩගේ පොත් සමාගම, මරදාන, නවමුද්‍රණය, 2015, 52 පිටුව.
3. පරිපුණ්ණො සබ්බථා සාධු - පණ්ඩිතෙයං පසංසිතො. වාචිස්සර හිමි, දෙවුන්දර, ථූපවංසො, ගොඩගේ පොත් සමාගම, මරදාන, නවමුද්‍රණය, 2015, 82 පිටුව.
4. - එම - 01 පිටුව.

කිඤ්චාපි සො යතිජනෙන පුරාතනෙන
අත්ථාය සීහළජනස්ස කතො පුරාපි,
වාක්කෙන සීහළබවෙනභිසංඛටත්තා
අත්ථං න සාධයති සබ්බජනස්ස සම්මා.
යස්මා ච මාගධනිරුත්තිකතොපි ථූප
වංසො විරුද්ධනයසද්දසමාකුලො සො,
වත්තබ්බමෙව ච බහුම්පි යතො න වුත්තං
තස්මා අහං පුනපි වංසමිමං වදාමි. - එම - 01 පිටුව.

5. මහින්දසෙන නාමම්හි - වසන්තො පරිවෙණෙකෙ,
පත්තචීවරපාදො - යො පිටකත්තය පාරගො. - එම - 82 පිටුව.
6. සාසනං සුට්ඨිතං යස්ස - අන්තෙවාසික භික්ඛුසු,
තෙන වාචිස්සරත්ථෙරෙන - පාදෙන ලිඛිතො අයන්ති. - එම -
7. පටිසම්භිදාමග්ගස්ස - යෙන ලීනත්ථදීපනී,
ටීකා විරචිතා සාධු - සද්ධම්මොදය කාමිනා.
විසුද්ධිමග්ග සංඛෙප - යෙන අත්තප්පකාසනා,
යොගීනමුපකාරාය - කතා සීහලභාසතො. - එම -
8. සුණාථ සාධවො සබ්බෙ - පරිපුණ්ණමනාකුලං,
වුච්චමානං මයා සාධු - වංසං ථූපස්ස සත්ථුනොති. - එම - 01 පිටුව.
9. අහං තෙන සමයෙන - සුජාතො නාම බ්‍රාහ්මණො,
තදාසාවකං බුද්ධං - අන්නපානෙනතප්පයි. බුද්ධවංස පාළි, සුජාතබුද්ධවංසය, 12 ගාථාව, 94 පිටුව, බුද්ධ ජයන්ති මුද්‍රණ.
අහං තෙන සමයෙන - ජටිලො උග්ගතාපනො,
අන්තලික්ඛචරො ආසිං - පඤ්ඤාභිඤ්ඤාසු පාරගූ. - එම - නාරදබුද්ධවංසය, 13 ගාථාව, 116 පිටුව.
10. වාචිස්සර හිමි, දෙවුන්දර, ථූපවංසො, ගොඩගේ පොත් සමාගම, මරදාන, නවමුද්‍රණය, 2015, 41 පිටුව.
11. - එම - 77 පිටුව.



12. - එම - 81 පිටුව.
13. - එම - 17 පිටුව.
14. - එම - 41 පිටුව.
15. - එම - 47 පිටුව.
16. තදා කිර භගවතො පූජාය සබ්බපාලිඵුල්ලා මූලතො පට්ඨාය යාව අග්ගා එකච්ඡණා අහෙසුං, න කෙවලඤ්ච යමකසාලෙයෙව සබ්බෙපි රුක්ඛාසාඛාසබ්බපාලිඵුල්ලාව අහෙසුං, න කෙවලඤ්ච තස්මිංයෙව උය්‍යානෙ සකලෙපි දසසහස්සචක්කවාළෙ ඵලූපගරුක්ඛා ඵලං ගණ්හිංසු. සබ්බරුක්ඛානං ඛන්ධෙසු ඛන්ධපදුමානි, වල්ලීසු වල්ලිපදුමානි, අකාසෙ උල්ලොකපදුමාකි, පඨවිතං භින්දිත්වා දණ්ඩකපදුමානි වුප්පිංසු. සබ්බො මහාසමුද්දො පඤ්චවණ්ණපදුමසඤ්චන්නො අහොසි. - එම - 17 පිටුව.
17. දසබලො ජයසුමනසුමනසදිසවණ්ණං දුප්පටචීවරං මණ්ඩලං පටිච්ඡාදෙත්වා නිවාසෙත්වා තස්සූපරි සුවණ්ණපාමඞ්ගෙන කුසුමකාලපං පරික්ඛිපන්තො විය, විජ්ජුලතාසස්සිරිකං කායබන්ධනං බන්ධිත්වා කනකගිරිසිඛරමත්ථකෙ ලාඛාරසං පරිසිඤ්චන්තො විය, සුවණ්ණචෙතියං පවාළජලෙන පරික්ඛිපන්තො විය, සුවණ්ණඝිසකං රත්තකම්බලෙන පටිමුඤ්චන්තො විය, සරදසමයෙරජනිකරං රත්තවපාහකෙන පටිච්ඡාදෙන්තො විය, ලාඛාරසෙන තින්තකිංසුසුමවණ්ණං රත්තවරපංසුකූලචීවරං පාරුපිත්වා ගන්ධකුටිද්වාරතො කනකගුහතො සීහො විය, .....දසසතනයනො විය, මහාබ්‍රහ්මා විය,...සරදසමයෙ ගගනතලං විය. - එම - 03 පිටුව.
18. ඝනබද්ධමොරපිඤ්ජකලාපො විය, නිරන්තරං මාලාදාමගවක්ඛිතො විය, සුට්ඨු පීළෙත්වා ආබද්ධපුප්ඵවටංසකො විය, සුපූරිතපුප්ඵචංගොටකං විය, - එම - 17 පිටුව.
19. අම්හාකං බුද්ධො අහුබන්තිවාදොති, බුද්ධභූමිං අප්පත්වාපි පාරමියො පූරෙන්තො ඛන්තිවාදතාපසකාලෙ ධම්මපාලකුමාර කාලෙ ඡද්දන්තහත්ථිකාලෙ සඞ්ඛපාලනාගරාජකාලෙ මහාකපිකාලෙ අඤ්ඤෙසුපි බහූසු ජාතකෙසු පරෙසං කොපං අකත්වා ඛන්තිමෙව අකාසි, ඛන්තමෙව වණ්ණයි. - එම - 24 පිටුව.